# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2024
2026 ජූලි /අගෝස්තු

## සමාජීය විද්‍යා පීඨය

## සමාජවිද්‍යාව

## සමාජ විද්‍යාවේ මූලික සංකල්ප - SOCI 18214

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. සමාජවිද්‍යාව ස්වාධීන ශාස්ත්‍රීය විෂය පථයක් ලෙස නිර්මාණය වීමට බලපෑ 19 වන සියවසේ යුරෝපීය ඓතිහාසික, බුද්ධිමය සහ සමාජ-ආර්ථික පසුබිම විශ්ලේෂණය කරන්න.

02. සී. රයිට් මිල්ස් (C. Wright Mills) හඳුන්වා දුන් "සමාජ විද්‍යාත්මක පරිකල්පනය" යන සංකල්පය පැහැදිලි කර පුද්ගලික ගැටලුවක් (personal problem) පොදු සමාජ ප්‍රශ්නයක් (public issue) ලෙස වටහා ගත හැකි ආකාරය කෙටි උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරන්න.

03. "සමාජ ස්තරායනය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කර ඒ පිළිබඳ කාල් මාක්ස්ගේ ඒකමාන ස්තරීකරණ ප්‍රවේශය (single-dimension view) මැක්ස් වේබර්ගේ බහු-මාන ප්‍රවේශයෙන් (Multidimensional approach) වෙනස් වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

04. සම්ප්‍රදායික සහ නූතන සමාජ ව්‍යුහයන් තුළ 'ආරෝපිත තත්ත්වය' (Ascribed Status) සහ 'සාධිත තත්ත්වය' (Achieved Status) ක්‍රියාත්මක වන ආකාරය විස්තර කරන්න. නූතන සමාජය සැබවින්ම ආරෝපිත ස්තරීකරණ පද්ධතීන්ගෙන් බැහැර වී තිබේදැයි සමාජ විද්‍යාත්මකව තර්ක කරන්න.

05. "ප්‍රාථමික සමූහ අපගේ මූලික අනන්‍යතාවය හැඩගස්වන අතර, ද්විතීයික සමූහ අපගේ වෘත්තීය සහ පොදු ජීවිතය මෙහෙයවනු ලබයි." සමාජ සමූහ නිර්වචනය කරමින් සහ ඒවායේ එකිනෙකට වෙනස් ලක්ෂණ පැහැදිලි කරමින් මෙම ප්‍රකාශය ඇගයීමට ලක් කරන්න. ඩිජිටල් අවකාශයන් (digital spaces) සහ සමාජ මාධ්‍යවල (social media) නැගී සිටීම මෙම කණ්ඩායම් වර්ග දෙක අතර පවතින සම්ප්‍රදායික සීමාවන් බොඳ කිරීමට බලපා ඇති ආකාරය පැහැදිලි කරන්න.

06. මානව අනන්‍යතාවය හැඩගැස්වීම සහ සමාජ අනුපිළිවෙල (social order) පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සමාජානුයෝජන ක්‍රියාවලියේ කාර්යභාරය සාකච්ඡා කරන්න.

07. "නූතන පවුල පිරිහීමට ලක්වෙමින් පවතින්නක් නොවේ; එය සරලවම විවිධාංගීකරණය වෙමින් පවතින්නකි." සාම්ප්‍රදායික විස්තෘත පවුලේ සිට න්‍යෂ්ටික, තනි දෙමාපිය, සහවාසී (cohabiting) සහ සමලිංගික පවුල් ව්‍යුහයන් දක්වා සිදුවී ඇති පරිවර්තනය පැහැදිලි කර එම පරිවර්තන සමාජ ස්ථාවරත්වයේ මූලික නියෝජිතයෙකු ලෙස පවුලේ කාර්යභාරය දුර්වල කර ඇත්දැයි අවධානය යොමු කරමින් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

08. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට (02) සටහන් ලියන්න.

    අ. ආගමේ සමාජීය කාර්යභාරය

    ආ. හර්බට් ස්පෙන්සර් (Herbert Spencer)

    ඇ. අවිධිමත් සමාජ පාලනය

    ඈ. හැරියට් මාර්ටිනි (Harriet Martineau)

******************************